LA TROBE TAXATION SERVICES
Your friendly tax accountants



La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.

La Trobe Taxation Services
Registered Tax Agent
(ABN 67 251 931 300)

CONTACT
Bundoora:
Mala: - 0401000421 or 03-94708241
Cranbourne:
Janaka:- 0403728635 or 03-87868033

Email: latrobetax@yahoo.com.au

www.latrobetax.com.au

You & Me
Children Development Program
Aus Reg: No: A0093521M

WITH ZERO ADMIN COST

INVITATION TO VOLUNTEERS FOR DIRECTOR BOARD OF You & Me

We are Planning to set up a Voluntary Organization on behalf of the Sri Lankan Needy Children.
We are happy to invite all interested parties to join us to work as Volunteers for the Director Board and Other areas.

For more Information
Sujith : 0412 819 113 | Bathiya : 0416 745 794
P.O. Box 178, Chadstone Centre, VIC 3148, Australia.
youandmeaustralia@gmail.com

# ඔක්කොම ලෙඩ්ඩු ය ඔක්කොම දොස්තරු සමග දර්ශනයට පෙරවදනක්

අජිත් පැරකුම් ජයසිංහ



ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය මාර සංවේදී නිසා එය පමණක් වෙළඳපොළකරණය නො ඉවසා, එය පමණක් රජය විසින් පමණක්, නොමිලේ පමණක් දිය යුතුයි කියන විප්ලවවාදීහු සිටිති.

පෙර පාසල් අධ්‍යාපනය ද මිනිස් ජීවිතයට වෛද්‍ය විද්‍යාව තරම් ම වැදගත් බව අපි අමතක කරමු. මන්ද, පෙර පාසල් අධ්‍යාපනය ගැන කතා කරන්නට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වැනි ධනවත් සමිති නැත. එසේම, පෙර පාසල් ගුරු-වරියක වීම සමාජ ලාලසාවක් හෙවත් අත්පත් කර ගැනීමට හූල්ල හූල්ලා බලා සිටින තත්වයක් නො වේ. ඒ නිසා ඒ ගැන කතා කිරීමෙන් අපට දේශපාලන බලය ගොඩනගා ගත නො හැකි ය.

දොස්තරලාගේ කූට ජාවාරම් ද ඉවසමු. මන්ද, දොස්තරකම යනු සාමාන්‍ය තවත් එක් වෘත්තියක් පමණක් නො වේ. අර ලාලසාව නිසා දොස්තරකම යනු ආශාවකි.

එහෙත්, වෛද්‍ය විද්‍යා අධ්‍යාපනය සෙසු සියල්ලට වඩා මිනිස් ජීවිතයට සංවේදී ය කියන අය පහත සඳහන් කාරණය ගැන කිසිවෙක් කතා නො කරන්නේ ඇයි?

ලංකාවේ දොස්තරලා තරමට ම හොර දොස්තරලා සිටිති. ඇලොපති වෛද්‍ය විද්‍යාව අනුව හොර දොස්තරකම ලෙස හැඳින්විය හැකි ගර්හිත විද්‍යාවන්ට රජයෙන් උපාධි ද දෙනු ලැබේ. ඒවා හැඳින්වෙන්නේ දේශීය වෛද්‍ය උපාධි ලෙස ය. එක්සත් ජාතික පක්ෂය පසුගිය මහ මැතිවරණයට ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ජ්‍යෝතිෂ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමේ යෝජනාවක් ද තිබිණි. අලි මදිවාට හරක් ය. ඉන් පසු මෙම උපාධිධාරීන්ට රස්සා දීමට පාසල්වල ජ්‍යෝතිෂය විෂය හඳුන්වා දීමටත් සිදු වනු ඇත.

මෙම ප්‍රකාශය මතභේදාත්මක බව මම පිළිගනිමි. මන්ද, ඇලොපති වෛද්‍ය විද්‍යාව අධිපති කතිකාව බවට තහවුරු වීම පසුපස තිබෙන දැනුම ක්‍රියාවලිය අහිංසක එකක් නො වේ. එය පසුපස දැනුම සම්බන්ධ ආක්‍රමණශීලීත්වයක් තිබේ. එයට එරෙහිව විකල්ප දැනුම වෙනුවෙන් පෙනී සිටීම එක්තරා අන්දමක අධිපති විරෝධී ක්‍රියාවකි.

2004 වසරේ ප්‍රදර්ශනය කරන ලද, මයික් ලෙයි විසින් අධ්‍යක්ෂණය කරන ලද වේරා ඩ්‍රේක් චිත්‍රපටය මේ පිළිබඳ සාකච්ඡා කරන අවස්ථාවකි. අධිපති දැනුම විසින් සම්ප්‍රදායික දැනුම හෙළා දකිනු ලැබීම එහි තේමාවයි. වේරා ඩ්‍රේක් ගබ්සා සිදු කරන්නේ සමාජ සේවාවක් ලෙස සලකා ය. එහෙත්, එය නීති විරෝධී ය. චිත්‍රපටය පිළිබඳ මෙතැනින් කියවිය හැකි ය.

එහෙත්, ලංකාවේ තිබෙන වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ ප්‍රශ්නය මෙය නො වේ. බටහිර වෛද්‍ය විද්‍යාව ව්‍යාප්ත වන්නට පෙර ගමේ සිටි වෙද මහත්තයා සමග පටලවා ගත යුතු නැත. අද පවතින්නේ එම තත්වය නො වේ. අද වන විට දොස්තරවරු තරමට ම හොර දොස්තරවරු, වෙද්දු, ප්‍රාතිහාර්යකරුවෝ, කේන්ද්‍රකාරයෝ, කට්ටඩි සහ වෙනත් තක්කඩි සිටිති. ඔවුන්ට මුග්ධ දේශපාලකයන්ගේ අනුග්‍රහය ලැබෙන බැවින් ඔවුහු දවසින් දවස ව්‍යාප්ත වෙති. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සමයේ මෙවැන්නන් විශාල පිරිසක් මහජන මුදලින් නඩත්තු කරන ලදී.

හදිසි අනතුරකින් පසුව, මහජන මුදලින්, නියමිත පරීක්ෂණ කිරීමෙන් අනතුරුව, ශල්‍යාගාරයක් තුළ අස්ථි නිසි පරිදි තබා දමන ප්ලාස්ටරයත් රැගෙන මරදන්කඩවල අස්ථි වෑල්ඩිං කරන බව කියන වෙදා ගාවට යන ලෙඩ්ඩු ඒවා මේස පිහිවලින් කපා විසි කර අත පය ඇදට සවි කර ගනිති. නැතිනම්, ආපසු රෝහල්වලට පැමිණ මහජන මුදල්වලට වග කියති.

ලංකාවේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය හෝ ඊනියා විප්ලවවාදීන් කිසිවෙක් මේවාට එරෙහිව සටන් කරන්නේ නැත. මාක්ස්වාදීන්, තවත් විවිධ දාර්ශනිකයන්ගේ ලාංකික නිල අලෙවි නියෝජිතයන් ලෙස පෙනී සිටින තවත් අය මේවා ගැන කට අරින්නේ නැත. හේතුව, එක් පැත්තකින් සමාජය ගැන නො දන්නාකමයි. නැතිනම්, තමන් ද සිය ජීවිත තුළ මේවා සමග බැඳී සිටීමයි. මා දන්නා එක් අසහාය විප්ලවවාදියෙක් සිය විප්ලවවාදී බිරිඳ කසාද බැන්දේ පන්සලේ පිරිත් සජ්ජායනයකින් පසු ය. ඒ අය දැන් අප මනෝ විශ්ලේෂණය කරන්නට එන විට අප ඔවුන් නම් නො කරන්නේ ලොව කිසිවෙක් පරිපූර්ණ නැති නිසා ය.

වර්තමානයේදී ලාංකීය සමාජය පෙළන ප්‍රධානත ම පීඩකයන් පිරිසක් වන්නේ හොර දොස්තරවරු, ජ්‍යෝතිෂකාරයෝ, කට්ටඩියෝ හා ආගමික ප්‍රාතිහාර්යකාරයෝ ය.

ආගමික ප්‍රාතිහාර්යකාරයන්ගේ ගණයට මාක්ස්වාදීන් ද ඇතුළත් කළ හැකි වීම මෙම ඊනියා විප්ලවවාදීන් මෙම පොදු කුලකයට එරෙහිව නො යාමට හේතුව විය හැකි ය. හාමුදුරුවරුන් නිර්වානය නම් ෆැන්ටසිය යෝජනා කරන්නා සේ මාක්ස්වාදී ආගමිකයෝ කොමියුනිස්ට් සමාජය යෝජනා කරති. ඒ වෙනුවෙන් පංති කිරීම වැනි විවිධ ආගමික ව්‍රතයන් හා මැයි දිනය, විරු දින වැනි අභිචාර තිබේ.

මේ සත්‍යය වසන් කරමින් ඇත්ත සමාජ පීඩකයන් හඳුනා ගනු වෙනුවට ව්‍යාජ සතුරන් සහ ෆැන්ටසි ප්‍රවර්ධනය කරන ඊනියා විප්ලවවාදීන් හඳුනා ගැනීමට අප සමත් විය යුතු ය.

න්‍යාය හා දර්ශනය යනු තමන්ගේ භෞතික ජීවිතයෙන් බැහැර හුදු මනස හා සම්බන්ධ දෙයක් පමණක් නො වේ. එය භාවිතාවකි. ලංකාවේ මේ මොහොතට අදාළව නම් අවිද්‍යාවට, මිථ්‍යාවට එරෙහි දැවැන්ත අරගලයක් තිබේ. පෝරුවල නො නැග, නැකැත් නැතිව කසාද බැඳීම, නැකැත් නැතිව, කේන්දර නැතිව දරුවන් හැදීම, මිරිස් කරල්, දෙහි ගෙඩි නො එල්ලා, මග දිගට පඬුරු නො දමා වාහන පැදවීම, මාක්ස්වාදය ද ඇතුළු ආගම්වලින් බැහැර වීම ආදිය මේ අරගලයේ කොටස් ය. ජීවත් වීම ම දර්ශනය වෙනුවෙන් කරන අරගලයකි.

අපට අපගේ ජීවිතය තුළ ලොව සියලු දාර්ශනිකයන් කියවා දර්ශනවාදයන් රැස් කර ගබඩා කර ගත නො හැකි ය. අපට කළ හැක්කේ අප වෙනුවෙන්, යුගයට සාපේක්ෂ, ඉදිරිගාමී දර්ශනයක් ගොඩනගා ගැනීමයි. එය ස්ථිතික දෙයක් නො වේ. එය ද ඇත්තේ චලනයක ය. චලනය තුළ දැවැන්ත වෙනස් වීම් වුව වලංගු ය.